# සූරියකන්ද බේදවාචකය



සූරියකන්ද සිසු ඝාතනය අපේ රටේ සිදුවූ අති බිහිසුණු කෲර බේදවාචකයකි. මේ එම ඝාතනය පිළිබඳ රහස් පොලිසිය කළ අපක්ෂපාතී පරීක්ෂණයේදී ඊට මුල් වූ කරුණු ඇසුරින් සකස්වූ ලිපියකි.

08 කොටස



# අතුරුදන් සිසුන්ගේ මවුපියන් හඬා වැළපෙමින් සූරියකන්දට ඇදී එයි

**සුද්ද පවිත්‍ර කළ පළමු වළින් දැන් අඩි දෙකකට වැඩියෙන් පස් ගොඩ දමා තිබේ. එහෙත් මිනී වළක ලකුණක් නම් නොමැත. "මේක පරණ වැසිකිළි වළක් වගේ" කවුරුන්දෝ කීවේය. ජනාවාසයක් නැති මේ කඳු මුදුනේ වැසිකිළි හදන්නෙ කවුද? තව එකෙක් පිළිතුරු දුන්නේය. "හාරල බලමුද? මෙහෙන් හාරන්න" ආදී උපදෙස් දෙමින් අනුරුද්ධ රත්වත්ත පිරිස දිරිමත් කළේය. දැන් දහවල් 11ටත් ආසන්නයේ අඩි තුනකට වැඩි පස් ප්‍රමාණයක් ගොඩ දමා තිබේ. දිරා ගිය ලී කැබැල්ලක් දෙකක් හැරෙන්නට යමක් හමු නොවුණි.**

මේ අතර ඇඳි පාලම අසල වළ සෙවීමට යෙදවූ පිරිස හිස් අතින් කුලුන අසලට පැමිණියා. "වැඩේ අසාර්ථකයි. හමුවුණේ හිස් පතරොම් කිහිපයක් විතරයි'' ඔවුහු ප්‍රකාශ කළහ. එය බුල්ඩෝසර් කැපුමේ පළමු වළ කණින්නන්ද මන්දෝත්සාහී තත්ත්වයට පත් කළේය.

දි. මු. ජයරත්න මන්ත්‍රීවරයා එහිදී අලුත් යෝජනාවක් කළේ "අපි ඉල්ලම් ගල් ඉන්නකින් වළ ගැඹුර බලමු." ඔහු ගල් ඉන්නක් ගෙන වළ මැදට ඇන්නේය. සැමගේ මුහුණුවල කුතුහලය මතු කරවමින් අඩි හතක් පමණ එම ගල් ඉන්න එක විටම අඩි පහකට වැඩියෙන් ඉතා පහසුවෙන් යටට ගියේය. ආපසු ගල් ඉන්න ඉහළට ගත් විට වස ගඳක් පැතිර ගියේය. ජයරත්න මහතා ගල් ඉන්නේ තුඩ මාධ්‍යවේදියකුගේ මුහුණට ළං කළේය. ඔහු එහි අග ඇඟිල්ලෙන් අල්ලා බැලීය. මේක පරණ වැසිකිළි වළක් ඒකයි ගඳ. නැවත පරණ මතය මතු විය.

ඒක වෙන්න බැහැ. ගල් ඉන්නේ තුඩෙහිත් තැවරී තිබූ කිරි පැහැති ද්‍රව්‍ය ඇඟිල්ලට ගත් මාධ්‍යවේදියා ප්‍රකාශ කළේ වැසිකිළි වළක් නම්, මෙහි පරණ අසූචි කාලවර්ණ විය යුතුයි. මේවා කිරි පාටයි. මාධ්‍යවේදියා තර්ක කළේය. බහුතරය පිළිගත්හ. වළ කැණීම යළි ඇරඹිණි.

පෙරවරු 11.20ට පමණ වළ වටා සිටියෙක් "හා හා පරිස්සමෙන් පරිස්සමින්'' යි කෑ ගැසුවේය. මසුත් සමග උඩට ආවේ මස් දියවී ගිය තරුණ අත් දණ්ඩකි. සියල්ලෝ වළ වටා රොක් වූහ. වළ කැණීම නොදැනුවත්වම වේගවත් විය.

"ඔය තවත් අතක්... හක්කක්... අන්න කකුලක්... බෝල් පොයින්ට් පෑනක්. සාක්කුවේ ගහපු එකක්ද කනේ ගහපු එකක් ද අන්න අන්න ඔළුවක්. අර තවත් ඔළුවක්."

වළ කැණීම් නතර විය. සංවිධායකයෝ එක් වී සාකච්ඡා කළහ. නීතිඥ එස්.ඒ. ප්‍රේමරත්න මහතාත් මන්ත්‍රී පවිත්‍රා වන්නිආරච්චි මහත්මියත් වහා ඇඹිලිපිටි අධිකරණය වෙත යා යුතු යැයි තීරණය කළෙන් ඔහු සමඟ කවුරු හරි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු යා යුතුයි. යෝජනා වූයේ මංගල සමරවීර මන්ත්‍රීවරයාගේ නමයි. ඒ සමඟ ඡායාරූප ශිල්පී ආර්. ගුණසේකර ද යැවිනි.


ඔවුන් ඇඹිලිපිටි යෑමට වාහනයට ගොඩ වීමත්, සමඟ "මෙන්න සරමක් සිවුරක්'' යන හඬ අනෙක් වළ කණින තැනින් ඇසුනි. මිනී වළවල් ගොඩ දැමීම තාවකාලිකව නතර විය. අධිකරණ නියෝගය ලැබෙන තෙක් විවේක ගැනීමට තීරණය විය.

සූරිය කඳු මුදුනේ සිට ඇඹිලිපිටියට ගොස් ආපසු ඒම යනු සැතපුම් අනූවක ගමනකි. අධිකරණයට මෝසමක් ඉදිරිපත් කළ බවත් මහෙස්ත්‍රාත්වරයා ස්ථානයට පැමිණෙන බවත්, සෙන්ටර් දුරකථනය මගින් උසාවියෙන් කළ විමසීමකදී දැනගන්නට ලැබුණි. උසාවි ගිය නීතිවේදීන් එන තෙක් වැඩිදෙනා කඳු ගැටේ වාඩි ගෙන සිරි නැරඹූහ. අඩි 4400 උස එම ස්ථානය දක්වා වැටී ඇති දඟර පාර දෙස ඇස් යොමා සිටියෙකි. "අන්න පොලිස් ජීප් එකක්'' යැයි හඬ ගෑවේය. "පොලිස් වාහන කීයක් එනවාද'' මන්ත්‍රීවරයෙක් ප්‍රශ්න කළේය.

විනාඩි ගණනකට පසු පොලිසිය ළඟා විය. ඉන් බැස අප වෙත පැමිණියේ සහකාර පොලිස් අධිකාරි සුනිල් පෙරේරා ය. බස්නාහිර මහ ඇමැතිනි හා පාර්ලිමේන්තු මන්ත්‍රීන් වෙත පැමිණි ඔහු, මෙය නීති විරෝධී වැඩක් පළමුව කළ යුතුව තිබුණේ, පොලිසියට පැමිණිලි කිරීමයි. අධිකරණ නියෝගයකින් තොරව මිනී වළවල් හාරන්නට බැහැ"යි ඔහු ප්‍රකාශ කළේ ය.

"මෙතන නීති විරෝධී වැඩක් සිදුවී නැහැ. මිනී දැමූ වළවල් පිළිබඳ ලැබුණු ආරංචියට අනුව එහි ඇත්ත නැත්ත බලන්නයි අපි ආවේ. මේ වළවල්වල මිනී තිබෙන බව දැනගත් වහාම අපි කළේ හැරීම නවතා අධිකරණ අවසරය ලබා ගැනීමයි. අපි මේ ඉන්නේ මහෙස්ත්‍රාත්තුමා මෙහි ළඟා වෙනකම්." මහ ඇමැතිනිය කරුණු පැහැදිලි කළාය.

"ඇයි දැන්වත් පොලිසියට මේ ගැන පරීක්ෂණ අරඹන්න බැරි?" මාධ්‍යවේදියෙක් ඔහුගෙන් විමසුවේය.



"එහෙම කරන්න කවුරුහරි පොලිසියට පැමිණිල්ලක් කළ යුතුයි.'' ඔහුගේ පිළිතුර විය.

"හොඳයි ඔබ වගකිවයුතු නිලධාරියෙක් අපි පුරවැසියන් වශයෙන් දැන් ඔබට පැමිණිලි කරනවා.''

"මහෙස්ත්‍රාත්වරයා මෙහි දැන් පැමිණෙන නිසා අපි මේ විවාදය නතර කරමු." දෙබස නතර විය. සහකාර පොලිස් අධිකාරිවරයා ටෙලිකොම් කුලුන වෙත ගියේ ය.

මහෙස්ත්‍රාත් නියෝග ලබාගත් නීතිඥවේදීහු ජයග්‍රාහී විලාසයකින් එහි පැමිණ මහෙස්ත්‍රාත්වරයා තව ස්වල්ප වෙලාවකින් පැමිණෙන බව වාර්තා කළහ. මේ වසරේ අධිකරණ වාරයේ ආරම්භ දිනය එදින බවත්, මේ මහෙස්ත්‍රාත්වරයා අලුතෙන් පැමිණ එදින වැඩ භාරගත් මහෙස්ත්‍රාත්වරයකු බවත් ඔවුහු හෙළි කළහ.

ඒ වනවිට සබරගමුව පළාත් සභාවේ දී එම්. සෙනෙවිරත්න, එස්. රණතුංග උපාසක මහත්තයා ප්‍රමුඛ පළාත් සභා මන්ත්‍රීවරු ඇතුළු විශාල කණ්ඩායමක් රත්නපුර ප්‍රදේශයෙන් එහි පැමිණියහ.

සවස 4 පමණ වන විට ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් පී. රණසිංහ මහතා ස්ථානයට පැමිණියේය. කෙටි සාක්කි සටහන් කර ගැනීමකින් පසු වළවල් හැරීම ඇරඹිණි.

මිනී ඔළු කටු හත අටක්, අත්පා, කොඳු ඇට, ඉළ ඇට, සරං, කමිස ඇස් බැඳ දමා තිබූ රෙදි, බැම්ම සමඟ මිනී ඔළු එකට ගැටගසා තිබූ අත් ක්‍රමයෙන් වළ ගැටේ ගොඩ ගැසෙන්නට විය. ඒවා තරමක් වියළි සිරුරු කොටස් ඇති දිය කුණු මස් වැදලි සහිත රූරා හැලෙන මස් කොටස් සමග අත පාවලින් ගොඩට එන විට නැගුණු දුගඳ විසින්ම වළ අසල වූවෝ ඈතට තල්ලු කර දමනු ලැබූහ. බොහෝ සිරුරු කකුල් දෙකෙන් ඔසවා වළට බහලනු ලැබූ ස්වරූපයකින් පැවතීම විශේෂයකි.

මහෙස්ත්‍රාත්වරයා අනෙක් වළ වෙතට ගියේය. එය අනෙක් වළ මෙන් නොව විශාල ප්‍රදේශයක පැතිරුණු වළකි. බොහෝ විට නායයෑම් නිසා සෑදුණු ගැඹුරු විශාල වළක් ලෙසින් දැකිය හැකිය. එහි මළ සිරුරු ඇතිරූ ස්වභාවයක් ගත්තේය. ඇඳුම් සමඟම සිරුරු එහි විය.

අඳුර වැටෙත්ම මිනී ගොඩ දැමීම මහෙස්ත්‍රාත්වරයා නතර කිරීමට නියෝග කර ඉතිරි සිරුරු ගොඩ දැමීම 1994 ජනවාරි 8 දිනට කල් තැබීය.

"වළවල් ආරක්ෂා කිරීමට පොලිස් මුර යොදන්න'' යැයි කොලොන්න පොලිසියට මහෙස්ත්‍රාත්වරයා නියෝග කළ අතර සිරුරු කොටස් කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරි හා රජයේ රස පරීක්ෂක වෙත යැවීමටත් සිරුරු හිමියන්ගේ ස්ත්‍රී පුරුෂභාවයන්, වයස්, මරණයට හේතු ආදිය පරීක්ෂා කොට වාර්තා ලබා ගැනීමටත් නියෝග කළේය.

සූරියකන්දේ මිනී වළවල් සොයාගැනීම පැය කිහිපයකදී ඇඹිලිපිටිය ප්‍රදේශය සසල කරන පුවතක් බවට පත්වී, අතුරුදන් කළ පාසල් සිසුන්ගේ මාපියෝ, ඥාතීහු, සහෝදර සහෝදරියන් පමණක් නොව, පාසල් සිසුහු පවා පැය කිහිපයකදී එතනට පැමිණියහ. දරුවන්ගේ ඇට කටු හඳුනාගැනීම සඳහා ඔවුන් හමුදා කඳවුරට රැගෙන යන විට ඇඳ සිටි ඇඳුම්වල රෙදිවලට සමාන රෙදි කැබිලි රැගෙන පැමිණ සිටි අම්මලා තාත්තලා ඊට සමාන රෙදි කඩක් සහිත සිරුරු කොටසක් ගොඩ දමන විට "අනේ ඒ මගේ පුතා ඒ මගේ දරුවාගේ සරම'' ආදිය කියමින් විලාප දෙන්නට වූහ.

ජනවාරි 8 දින ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත්වරයා හමුවේ සූරියකන්ද මුදුනේ ඇති ඉතිරි සියලු මිනී වළවල්ද කැණීම් කටයුතු සිදු කරනු ඇත. එහි වළලා තිබෙන පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොතෙක් ද යන්න හරියාකාරව දැනගත හැකිවනු ඇත්තේ එදාට ය. එහි මිහිදන් කොට සිටින අයගේ සංඛ්‍යාව සීයත් දෙසීයත් අතර ප්‍රමාණයක් විය හැකිය, යන්න තතු දත් අයගේ මතය වී ඇත. ඒ සියලු දෙනා කාගේ කවුරුන්ද යන්න හඳුනා ගැනීමට නොහැකි වනු ඇතත්, කිසියම් පිරිසක් හෝ හඳුනා ගැනීමට සාක්ෂි ලැබිය හැකිය. ඒ මගින් යටපත් වී තිබෙන රහස් කිසියම් ප්‍රමාණයකට හෝ හෙළිදරව් කර ගැනීමට හැකි වනු ඇත.

මරා දමා තිබෙන මේ අයට නැවත පණ දීමේ හැකියාවක් නැතත්, මේ පුංචි ලංකාව වසාගෙන තිබෙන මිනීමරු දේශපාලන සදාචාරයේ කළු වලාවන් පලවා හැර, භීතියෙන් තොරව ජීවත්විය හැකි සමාජ පරිසරයක් ඇති කර ගැනීමේ කාරියට සූරියක්කන්දේ කළ කැණීම් යම් ප්‍රමාණයකට හෝ හේතු වනු ඇති බවට සැකයක් නැත.